**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2014**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු පොළී ආදායම් රු.91,147 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) පිරිවැය රු. 385,518,203 ක් වූ නේවාසිකාගාර හා පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය තුල නිමකර භාවිතයට ලබාදී තිබුණද එම වටිනාකම් ප්‍රාග්ධනිත නොකර නොනිමි වැඩ යටතේ දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සිදුකිරීමටද කටයුතු කර නොතිබුණි.

**2.2.2 නොසැසඳූ පාලන ගිණුම්**

2014 වර්ෂය සඳහා කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සවිකිරීම් සහ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ වල එකතුකිරීම් (Addition) සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛනයෙහි හා ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වටිනාකම් අතර රු.348,749 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ නේවාසිකාගාර සිසුන්ගෙන් අයකරගත යුතු රු.82,280 ක් වූ හිඟ නේවාසිකාගාර ගාස්තු 2015 ජුලි 15 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.594,145 කින් රු.153,338 ක් වර්ෂ 01 සිට වර්ෂ 02 දක්වා කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ඇ) සේවක භාරකාර අරමුදලට වැඩිපුර ප්‍රේෂණය කර තිබූ රු.31,708 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන නොතිබූ අතර 2006 වර්ෂයේ සිට ගබඩා භාරකාරිනියක ලෙස සේවය කළ නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.67,259 ක මුදල වර්ෂ 09 කට වැඩි කාලයක සිට අය කරගෙන නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5:8 වගන්තිය | නිල නිවාසයක් හිමි නිලධාරියකු එය පරිහරණය කිරීමේදී ඒ සඳහා වූ බිල්පත් අදාළ නිලධාරියා විසින් ගෙවිය යුතු වුවත්, උපකුලපති තමාගේ පෞද්ගලික නිවසේ පදිංචි වී එහි ජල හා විදුලි බිල්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා එකතුව රු.273,408 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීමේ ලේඛන සහ නිවාඩු ලේඛන මඟින් පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.211,838,951 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 394 (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබූ රු.47,579 ක් වටිනා අවලංගු කළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ජංගම ගිණුමක් ඇති සෑම ආයතනයක්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත්, 2015 ජුනි 19 විගණන දින වන විට අවසන් වරට පිළියෙල කර තිබුණේ 2015 අප්‍රේල් 30 දිනට අදාල බැංකු සැසැඳුම බව නිරීක්ෂණය විය. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ වටිනාකම රු.257,439 ක් වූ චෙක්පත් 35 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | (i) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය විසින් සකස් කරනු ලබන අයවැය ඇස්තමේන්තුවක් මත පිහිටා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන මුදල් කමිටු නිර්දේශය හා පාලක සභා අනුමැතිය මත රු.895,234 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.<br><br>(ii) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 සහ 2014 ජුලි 24 දිනැති අංක 06/2014 (i) දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපි වලට අනුව සංග්‍රහ වියදම් ගෙවීම් වලට |

| | | |
|---|---|---|
| | | අදාල වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවට දීමනාවක් ලෙස මාසිකව නිලධාරින්ගේ මූලික වැටුපින් සියයට 8 සිට සියයට 20 දක්වා ප්‍රතිශතයක් ගෙවීමට තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.769,985 ක් සංග්‍රහ වියදම් දීමනා ලෙස ගෙවා තිබුණු අතර වැටුප් පදනම් කර දීමනාවක් ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබීම හේතුවෙන් එය වැටුප් විෂමතාවයන් කෙරෙහිද බලපා ඇති බව නිරීක්ෂණය විය. |
| (ඉ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය සහ 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන පහසුකම් හිමි නිලධාරින් සඳහා කාර්යාලයේ සිට නිවස දක්වා ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි වුවත් චක්‍රලේඛයන්ගෙන් බැහැරව මාසිකව එක් නිලධාරියෙකුට රු.30,000 බැගින් නිලධාරීන් 05 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,669,193 ක් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. |
| (ඊ) | 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීමෙන් ලැබෙන සියළුම ලැබීම් ආයෝජනය කළ යුතු වුවත් ගිවිසුම් කඩකිරීමෙන් වසර 02 කට පෙර ලැබී තිබුණු රු.1,494,871 ක් ආයෝජනය කර නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැරව උපකුලපතිවරයාට හිමි මාසික ඉන්ධන දීමනාව වෙනුවට සීමාවකින් තොරව නිල වාහනය වෙත ඉන්ධන සැපයීම නිසා සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන ලීටර 2085.70 ක් වෙනුවෙන් රු.335,883 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3. 1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,414,730 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.18,668,242 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.12,253,512 කින් අඩු වීම සඳහා රජයේ ප්‍රදාන රු.45,999,444 කින් වැඩි වීම හා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ ආදායම රු.25,656,869 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ ආධාර උපයෝජනය හා පර්යේෂණ දීමනා ගෙවීම

සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු රු.1,000,000 ක් වූ පර්යේෂණ ආධාර මුදලින් රු.302,857 ක් පමණක් උපයෝජනය කර තිබුණි. පර්යේෂණ දීමනා සඳහා ප්‍රතිපාදිත මුදල රු.19,700,000 ක් වූ අතර අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා රු.17,679,206 ක වියදමක් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ දීමනා ලබා ගත් ආචාර්යවරු 110 ක් අතරින් 43 දෙනෙකු තම පර්යේෂණ පිළිබඳ ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පර්යේෂණ පරිසංවාදය

2014 වර්ෂයේ පර්යේෂණ පරිසංවාදය 2014 නොවැම්බර් 18 හා 19 දිනයන්හි පවත්වා තිබූ අතර ඒ සඳහා රු.279,119 ක් වියදම් දරා තිබුණි. මේ සඳහා දෘෂ්‍ය කලා පීඨයෙන් ආචාර්යවරුන් හා නිලධාරීන් 10 දෙනෙකු ද, සංගීත පීඨයෙන් දෙදෙනෙකු ද, නර්තන හා නාට්‍ය කලා පීඨයෙන් 06 දෙනෙකුද වශයෙන් වාර්තා 18 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමට අදාල නිර්ණායකයන්වලට අනුව පර්යේෂණ නිර්ණායකයන් වැදගත් වුවද පර්යේෂණ සඳහා යොමුවීම හා කැපවීම පහළ මට්ටමක පැවතීම නිසා සමාලෝචිත වර්ෂයේ ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 14,524 වන ස්ථානයේ පසු වන බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.2,117,041,000 ක් වටිනා ඉඩම් 06 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතිය විගණිත දිනය වන 2015 ජුලි 15 දින දක්වා විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් කඩකරන ලද ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් රු.1,617,048 ක මුදලක් අයකර ගත යුතුව තිබූ අතර මූල්‍ය ප්‍රකාශන වල මේ පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම වර්ෂ 3 සිට වර්ෂ 7 දක්වා වූ කාලයක සිට පැවතෙන මෙම ලැබිය යුතු මුදලින් කොටසක් අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට කැමැත්ත ලබා දී තිබියදීත් 2015 ජුලි 15 දින දක්වා අර්ථසාධක අරමුදලින් අයකර නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි පර්යේෂණ සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියන් දෙදෙනෙකුට රු.1,000,000 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දී තිබුණි. මෙම පර්යේෂණ 2010 මාර්තු 01 දින ආරම්භ කර වසර තුනකින් නිම කළ යුතු වුවත් නියමිත දිනයට ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.250,000 බැගින් වූ අවසාන වාරික මුදල මුදා නොහැර රු.500,000 ක මුදලක් පර්යේෂණ අරමුදලෙහි රඳවා තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට පුස්තකාලයේ පොත් 37,710 ක් බැහැරට දී තිබූ අතර ඉන් රු.61,237 ක් වටිනාකමැති පොත් 96 ක් 2015 ජුලි 15 දින තෙක් ආපසු භාරදී නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අදාලව කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත හා තථ්‍ය සංඛ්‍යාව සමඟ සැසඳීමේදී පුරප්පාඩු 27 ක් හා අතිරික්ත සංඛ්‍යාව 35 ක් වූ අතර අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 39 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පත් කළ තාවකාලික කථිකාචාර්යවරුන් හා උපදේශකවරුන් 35 ක් වර්ෂය අවසන් දිනට සේවයේ නිරතව සිටි අතර දෘෂ්‍ය කලා පීඨයේ තාවකාලික කථිකාචාර්යවරුන් 15 දෙනෙකු හා උපදේශකවරු 05 දෙනෙකුගේ අතිරික්තයක් නිරීක්ෂණය විය. මේ අනුව අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කර ස්ථිර කාර්යමණ්ඩලයට බඳවා ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව සියයට 16 ක පුරප්පාඩු සංඛ්‍යාවක් වූ අතර විධායක කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 06 න් තනතුරු 04 ක් දිගු කාලයක සිට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) 2013 ජනවාරි හා පෙබරවාරි මාසවල රු.99,522 ක වියදමක් දරා කඩිනමින් පිරවීමට අවශ්‍ය තනතුරක් වූ විනයාරක්ෂක නිලධාරි (Chief Marshall ) තනතුර සඳහා පුවත්පත් දැන්වීම් පළකලද වසර 02 ට අධික කාලයක සිට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් සකස් කර තිබූ ක්‍රියාකාරි සැලැස්මට අනුව වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අරමුණු/ ඉලක්ක 07 ක් දක්වා තිබුණද, යම් නිශ්චිත කාල රාමුවක් තුල ක්‍රියාකාරකම් සඳහා වියදම් මූල්‍යායනය කිරීම හා අදාල වගකීම් දරන නිලධාරියා පිළිබඳව පැහැදිලි නිරූපණයක් නොවීය.

(ආ) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අදාල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂිකව ඇගයීම් කර ප්‍රගති වාර්තා සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 38 සිට සියයට 117 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) පුස්තකාල පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) ප්‍රසම්පාදනය